# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ද පේරන්ට්ස් පදනම (සංස්ථාගත කිරීමේ)

**ද පේරන්ට්ස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ**
**පනත් කෙටුම්පතකි.**

---

හම්බන්තොට දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මහතා විසින්
2016 පෙබරවාරි මස 24 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 ජනවාරි මස 25 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[84 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# ද පේරන්ට්ස් පදනම (සංස්ථාගත කිරීමේ)

**ද පේරන්ට්ස් පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

''ද පේරන්ට්ස් පදනම '' යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එම ඉල්ලීම ඉටු කිරීම මහජන යහපතට හේතු වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක දරන ද පේරන්ට්ස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ද පේරන්ට්ස් පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) ද පේරන්ට්ස් පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මෙහි මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''ද පේරන්ට්ස් පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) ශ්‍රී ලංකාවේ ළමා හා කාන්තා අභිවෘද්ධිය සාමාජීය, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයන් ඔස්සේ ඇති කිරීම ;

(ආ) ශ්‍රී ලාංකේය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සකලවිධ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීම ;

(ඇ) ආර්ථික හෝ මූල්‍ය දුෂ්කරතාවලට මුහුණපා සිටින ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ධෛර්ය දීම සහ උපකාර කිරීම සහ අඩු ආදායම් ලබන පවුල්වල ශිෂ්‍යයන්ට හෝ මව්පියන් දෙදෙනා ම, නැතහොත් ඔවුන්ගෙන් එක් අයකු මියගොස් ඇති ශිෂ්‍යයන්ට සහ එවැනි යම් අවාසිකර තත්ත්වයන්ට මුහුණපා සිටින ශිෂ්‍යයන්ට උසස් අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ආධාර දීම සහ ක්‍රියාශීලී ලෙස ධෛර්ය දීම ;

(ඈ) හෘද සැත්කම්, වකුගඩු බද්ධ කිරීමේ හා පිළිකා සැත්කම් වැනි අවශ්‍යතාවන් ඇති දුගී දුප්පත් ජනතාවට ඒ සඳහා යම් සහන සැලසීම ;

(ඉ) ශ්‍රී ලංකාවේ ළමා අභිවෘද්ධිය, අධ්‍යාපනික, ක්‍රීඩා, සාමාජීය, ආර්ථික හා සංස්කෘතික ක්ෂේත්‍රයන් ඔස්සේ ඇති කරලීම ;

(ඊ) අනාථ නිවාස හා මහලු නිවාස පිහිටුවීම සහ පවත්වාගෙන යාම සහ සමාජ සුභසාධනය ඇති කිරීම ;

(උ) අඳ, ගොළු, බිහිරි සහ ආබාධිත තැනැත්තන් සඳහා සුභසාධක පහසුකම් සැලසීම සහ නිවාස පිහිටුවීම ;

(ඌ) අසරණ සහ දුප්පත් ජනතාවට රෝද පුටු, කිහිලිකරු සහ ඇස් කණ්ණාඩි ලබා දීම ;

(එ) නිවාස නොමැති ජනතාව සඳහා නිවාස ඉදිකර දීම සහ ඉදිකිරීම් කටයුතු නිම කර ගැනීම සඳහා ආධාර දීම;

(ඒ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීමේ ලා නිරතවන ස්වේච්ඡා සේවකයන්ට හා වෙනත් තැනැත්තන් හට ශිෂ්‍යත්ව මගින් හෝ අන්‍යාකාරයකින් ආධාර දීම ;

(ඔ) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත්, සඟරා, සමරු කලාප, වාර සඟරා ආදියට දායක වීම සහ ඒවා නිකුත් කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා යෝග්‍ය වෙතැයි සලකනු ලබන වෙනත් සේවා සැපයීම ;

(ඕ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් සමිති, සංගම් හෝ සංවිධාන සමග සහයෝගී වීම සහ ඒකාබද්ධ වීම ;

(ක) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් ස්ථානයක දී සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යයන, දේශන සඳහා අනුග්‍රහය දැක්වීම හා ඒවා පවත්වා ගෙන යාම ;

(ග) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා යෝග්‍ය යැයි සංස්ථාව විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදා හැරීම ; සහ

(ජ) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීමට අවශ්‍ය ආනුෂංගික හෝ හිතකර වෙනත් යම් ක්‍රියා සහ දේ කිරීම හා ඉටු කිරීම ;

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**4.** (1) සංස්ථාවේ සියලු ම කටයුතු පරිපාලනය, කළමනාකරණය හා පාලනය කිරීම, මෙම පනතේ විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව මෙම පනතේ උපලේඛනයේ සඳහන් සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත සිදුවන්නේ ය.

(2) සංස්ථාවට අවශ්‍ය වුවහොත් නව සාමාජිකයන් පත් කිරීම හෝ පුරප්පාඩු පිරවීම මෙම පනතේ විධිවිධානවලට හා තත්කාලයේ රීතිවලට යටත්ව සංස්ථාවේ මූලික සාමාජික විසින් සිදු කරනු ලබන්නේ ය.

(3) උපලේඛනයේ සඳහන් සාමාජිකයෝ නිත්‍ය සාමාජිකයෝ වෙති. සාමාජිකයන්ගේ කැමැත්ත පවතින තාක් එකී ධූරය හිමි වන්නේ ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු

කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලු ම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් ඉටු කිරීමේ, කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) පහත දැක්වෙන සියලු ම කරුණු හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් කලින් කල සෑදීම නීත්‍යානුකූලව වන්නේ ය —

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම ;

(ආ) සංස්ථාවේ රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව රැස්වීම් කැඳවීම් සහ පැවැත්වීම පිළිබඳ කාර්ය පාටිපාටිය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත් කිරීම, බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම් ; සහ

(ඉ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාවේ දේපල පරිපාලනය හා කළමනාකරණය කිරීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ඇරඹෙන දිනයේ දී බලාත්මක පදනමේ කිසිම රීතියක්,(1) වන උපවගන්තියේ විස්තර කෙරෙන ආකාරයට මිස වෙනස් කිරීම, මින් මතු සෑදිය හැකි ඕනෑම රීතියක් හෝ ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ නොකරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී පැවති පදනම විසින් ගෙවිය යුතුව තිබූ සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු ව තිබූ සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල්, ප්‍රදාන සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය.

**8.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගනු ලබන ත්‍යාග, රික්තවරණ පැවරීම්, පරිත්‍යාග, සම්මාදම් මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය. සංස්ථාවේ අරමුදල.

(2) මේ පනත යටතේ සංස්ථාව සතු බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී, හා කිරීමේ දී සංස්ථාව විසින් වියදම් කරන ලද සියලු ම මුදල් අරමුදලින් ගෙවිය යුතු ය.

**9.** යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු බැහැර කිරීමකින්, හෝ වෙනත් යම් ආකාරයකින් හෝ පදනම වෙත සතු කරනු ලබන යම් චංචල හෝ නිශ්චල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපල සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව එකී දේපල විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාව සතු වන්නේ ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව.

**10.** සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු සාමාජික මුදල් ප්‍රමාණය ඉක්මවන යම් දායක මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය. සාමාජිකයන්ගේ වගකීම සීමා කිරීම.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ, දේපලක් ඉතිරි වුවහොත් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදාදීම තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපල.

ගිණුම් සහ විගණනය.

**12.** (1) සංස්ථාවට ලැබුණු සහ සංස්ථාව විසින් වියදම් කරනු ලැබූ සියලු මුදල් පිළිබඳව නිසි ගිණුම් පවත්වාගෙන යාමට සංස්ථාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම්, සෑම වර්ෂයක ම යටත් පිරිසෙයින් එක් වරක් හෝ පරීක්ෂා කොට විගණනය කරනු ලැබිය යුතු අතර, සංස්ථාව විසින් පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු විය යුතු විගණකවරයකු හෝ විගණකවරයන් විසින් ආදායම් සහ වියදම් පිළිබඳ ගිණුම් සහ ශේෂ පත්‍රය සහතික කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**13.** සභාපතිවරයා හෝ සභාව විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු හා සභාවේ තවත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**14.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින්, ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**15.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

## උපලේඛනය

| | |
|---|---|
| ඇසිලින් අලහප්පෙරුම | (අනුශාසක) |
| ඩලස් දහම් කුමාර අලහප්පෙරුම | (අනුශාසක) |
| ඕෂධී ජගත් කුමාර අලහප්පෙරුම | (මූලික සාමාජික) |
| සුජාතා අලහප්පෙරුම ගල්ගමුව | (සාමාජික) |
| නිහාල් පුෂ්ප කුමාර අලහප්පෙරුම | (සාමාජික) |
| ශ්‍රීනී කුමාරි අලහප්පෙරුම විජේසූරිය | (සාමාජික) |
| ප්‍රීති කුමාරි අලහප්පෙරුම ගුණවර්ධන | (සාමාජික) |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.